සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved



# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

# සිංහල - I

**13 ශ්‍රේණිය**

**කාලය පැය 03 යි.**

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

(01) පහත දැක්වෙන උද්ධෘත කියවා ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. (පිළිතුරු ලිවීමේදී වර්තමාන ලේඛන ව්‍යවහාරය ම යොදාගන්න.)

(අ) "නුවණැත්තවුන් විසින් ශීලවිශුද්ධිය කොටගෙන තමතමන්ට පිහිට විය යුතුය'යි වදාරා විසි වන මග්ගවග කෙළවර ගාථා දෙකින් බණ වදාළ සේක. දේශනා කෙළවර පටාචාරාවෝ පොළොව පස් විතරටත් බොහෝ කෙළසුන් ගෙවා සෝවාන් වීමෙන් ආර්‍ය ජාතියෙහි පිහිටා ජාතීන් ශුද්ධ කළහ. සංසාරදෝෂය නිසා ඇති නුගුණත් හළහ. නටුවා වූ ලොවී සැපතට ලොවුතුරා සැපතුත් යම්තම් විතරක් ලත්හ. සෙසුත් බොහෝ දෙන සෝවාන් ඵලාදියට පැමිණියාහ."

(1) තමන්ට පිහිට වන්නේ කෙසේද?

(2) ආර්‍ය ජාතියෙහි පිහිටියේ කෙසේද?

(3) නටුවා වූ ලොවී සැපත කුමක්ද?

(4) 'ලොවිතුරා' 'හළහ' යන පදවල අර්ථ දක්වන්න. (ලකුණු 04)

(ආ) "එබස් අසා සෝණුත්තර නම් වැදි පුත්‍ර තෙම මරණ භයින් තැතිගෙන දළ ගෙන්වීමෙන් ප්‍රයෝජන කිම්දැයි කියනුයේ ''දේවයන් වහන්ස, නුඹ වහන්සේගේ රාජ කුලයෙහි ජාම්බෝනද ස්වර්ණමය වූ මුතුමැණික් විදුර ආදිය ඔබා කරන ලද බොහෝ ආභරණත් ඇතිව තිබැදි මේ දළකඩ පලඳනා ප්‍රයෝජන නම් රට ඇති වැද්දන් මරණ පමණක් ම වේ දැ'යි කීයේ ය. ඉක්බිති බිසවු තුමූ මෙලෙස කියන්නී,'' වැදි පුත්‍රයාණෙනි, මට මීට පළමු වන ජාතියෙහි මේ ඇත් රජුට අගමෙහසුන් ව මා බලා සිටියදී අනික් අගමෙහසින් තෙතැන්තන්ට කරණ ආවේණික දැක ඊර්ෂ්‍යාවෙන් මඩනා ලදින් සපත්ති රෝෂයෙන් දුක්පත් වී චුත ව ද ඉදිරියෙන් සිතු වී මම සිතට බොහෝ දුක් වැදීමෙන් වියළෙමි."

(1) රාජකුලයේ ඇති අබරණ කෙබඳු වී ද?

(2) බිසව ඡද්දන්ත ඇතුගේ දළ ලබාගැනීමට හේතු වූ කරුණ කුමක් ද?

(3) 'ජාම්බෝනද ස්වර්ණමය වූ' යන්නෙහි අර්ථය ලියන්න.

(4) 'රාජ කුලයෙහි යන්නෙහි ව්‍යාකරණ ලක්ෂණ දක්වන්න. (ලකුණු 04)

(ඉ) "ඒ උපාසකයා ඔහු අතින් පිළි ඇරගෙන මතු මෙසේ සොරකමක් කෙරෙයි ද නො කෙරෙයි ද, යි කිය කියා, අතින් පයින් ඔහු තළා දුර්වල කොට අමුසොහොනට ඇදගෙන ගොස් පළමු ගෙන ගොස් දැමූ අලුත් මළ මිනිසෙකු අධෝමුඛ කොට මුහුණින් බිම හොවා ඔහු පිට සොරා උඩුකුරු කොට වැදහොවා දැත දෙපය පිට ඉස ආදී වූ තැන් මුදාගත නොහැකි පරිද්දෙන් වෙන වෙන ම තද කොට බැඳ හොවා තුමු ඉස්ශෝධා නහා පළමු කොට ගමට අවුත් ගම් මැද සිට 'එම්බා මේ ගම හැමදෙන ම මා කියන්නක් අසව. අද රාත්‍රියෙහි එක් අමනුෂ්‍යයෙක් එයි......"

(1) ඔහු පිළි සොරකම් කළේ කාගෙන් ද?

(2) සොරාට දුන් දඬුවම පැහැදිලි කරන්න.

(3) උපාසකයා ගම්වැසියන් අමතා ප්‍රකාශ කළේ කුමක් ද?

(4) 'අධෝමුඛ' යන්නෙහි විරුද්ධාර්ථ පදය ලියා 'වැදහොවා' යන්නෙහි අර්ථ ලියන්න.

(ලකුණු 04)

(ඊ) (1)

මෙරද රැපුන් කර පා වැජැඹි මෙ දියත
සගුණ මහල් සිවුපා සිවු බිතිනි යුත
දසරදදම් මිණිපා තෙද'ණ මැඳුරත
සතත සතන් සතපා කෙළෙය සුබසෙත

පසිඳු මොහුගෙ දළදන් දලදර පබඳ
දිළිඳු සිතෙහි කලිමල දෙව්යේ මතුද
කවිඳු වදන් බිම බැබළුම් කළ නිබඳ
සිනිඳු යසස්ලිය සුහුඹුල් කෙළෙ නොමඳ

(1) සතුරු රජුන්ට කළේ කුමක් ද?

(2) මෙහි එන රූපකාවලිය නිවැරදිව ලියන්න.

(3) දෙවන පද්‍යයෙහි සඳහන් ජලය හා කිලුට යනු මොනවාද?

(4) 'සිනිඳු යසස්ලිය සුහුඹුල් කෙළෙ නොමඳ' යන්නෙහි අර්ථ ලියන්න.

(ලකුණු 04)

The National e-learning Portal for The General Education

(2) පහත සඳහන් උද්ධෘත අතුරෙන් හතරක අවස්ථා සම්බන්ධය ලියන්න.

(1) "කපුටුවෝ බත් අනුභව කොට මෙලෙස ප්‍රාණවධ නොකරන්නා හ."

(2) "එහෙනම් ටිකක් ඇහුම්කන් දෙන්ඩ ඔන්න ඌ මොනවද කියනව."

(3) "තොපගේ දෙමව්පියෝ කිනම්හු ද?"

(4) "මේ අහස සිටිනා තබා සක්මන් කෙළෙහි නමුත් මින් ලබන දෙයක් නැත."

(5) "අගේ ඇති වැවර වතුර, ඉතින් යමු ටිකක් වාඩිවෙන්න."

(6) "මේක ඇතුළෙ කවුරුවත් නැද්ද බබා?"

(ලකුණු 08)

(උ) පහත දැක්වෙන කවිපෙළ පිළිබඳ රසාස්වාදයක් කරන්න.

අයස ළඟදි මා ළඟ සිටි යසවතිය
සසිරිබර සැපත නොම දුටු සිරිමතිය
නිරස කුලබොජුන් වැළඳූ රසවතිය
කටුක වැල් යහන සැරසූ පතිවතිය

පරමල කියා මා ගරහූ කුසුමාවී
අද වූ මනෙත දිවැසින් දුටු නයනාවී
මූ දේවිය ලෙස මා දුටු සීදේවී
නුඹේ සොහොන ළඟ නෙත් ලදුයෙමි දේවී

කැවද බීවදෝ කොහිදෝ අදත් ගියේ
නින්දට යන තුරුම නිදහස නසාවියේ
නුඹ නැති දා මටත් නිදහස එපා වියේ
ඇයි මා දා ගියේ මුර දේවතාවියේ.....

මේ අත් දනී දුන් හැටි බැට නිමක් නැති
මේ මුව දනී දුන් නොසරුප් බැනුම් වැසී
අනේ ගහබැනපු කිසිවක් හිතේ නැති
පාළුයි මගේ පැල අඳුරුයි පබාවතී...!

වද වද මගෙම පරපුර හොඳ හිතින් දරා
ලැබ ලැබ කටුක දුක් ගිනි නැඟුණ බුර බුරා
විඳ විඳ අපා දුක මට සැපත දුන් සරා
අබිනික්මන් කළේ ඇයි මගෙ යසෝදරා....!

(ලකුණු 16)

(02) මසුරු මානසිකත්වයේ පුපුරා හැළීමත්, ආසන්න ප්‍රියයන්ගේ හදිසි විප්‍රයෝගයේ කම්පනයත් මානව දයාර්ද්‍රබවකින් යුතු ව රචනා කරන්නට ධර්මසේන හිමි දැක් වූ කුසලතාව සද්ධර්මරත්නාවලියෙන් මැනවින් ධ්වනිත වේ. සනිදර්ශනව විමසන්න. (ලකුණු 15)

**නැතහොත්**

මෙලොව වශයෙන් යහපත් ජීවිතයක් ගතකිරීමට අවැසි උපදෙස් රසවත් කතා මාර්ගයෙන් ගෙන ඒමට ජාතික කතාකරු උත්සුක වී තිබේ. උක්ත කියමන උචිත ජාතක කතා දෙකකින් සනිදර්ශනව පහදන්න.

(ලකුණු 15)

(03) 'සුන්දර සුලලිත වර්ණනා පෙළකින් සමන්විත වූත්, සාර්වත්‍රික වටිනාකමකින් යුතු වූ අනර්ඝ ජීවිතාදර්ශ සපයන්නාවූත් සාහිත්‍ය ග්‍රන්ථයක් ලෙස සද්ධර්මාලංකාරය අගය කළ හැකිය.' නිර්දිෂ්ට කතාවස්තු ඇසුරෙන් උක්ත කියමන විමසන්න. (ලකුණු 15)

(04) 'ගිරා කවියාගේ අපූර්වත්වය වඩාත් ප්‍රකටවන්නේ ඔහු සතු වර්ණනා චාතුර්යය නිසා ය.' මෙම කියමන උචිත වැනුම් දෙකකින් දෘෂ්ටාන්ත සපයමින් විමසන්න. (ලකුණු 15)

(05) 'ආධ්‍යාත්මික ප්‍රේමයක අතීතාවර්ජනය තුළින් කලාකාමී සංවේදී සිත්තරෙකුගේ හදවතෙහි පිළිබිඹුවක් 'මළගිය ඇත්තෝ' නවකතාව තුළින් විද්‍යමාන වේ.' නිර්දිෂ්ට නවකතා ඇසුරෙන් සනිදර්ශන ව විමසන්න.

(ලකුණු 15)

(06) මිනිස් සිතෙහි පවතිනා සොඳුරු ගති ගුණ මෙන් ම අඳුරු චිත්ත ලක්ෂණ ද කෙටිකතා තුළින් ප්‍රකට වේ. නිර්දිෂ්ට කෙටිකතා තුනක් ඇසුරෙන් විමසන්න. (ලකුණු 15)

(07) 'කාව්‍ය නිර්මාණයක සාර්ථකත්වයට උපයුක්ත භාෂාව බෙහෙවින් ඉවහල් වේ.' නිර්දිෂ්ට පද්‍ය පන්ති තුනකින් නිදසුන් දක්වමින් සාකච්ඡා කරන්න. (ලකුණු 15)

(08) 'ශෘංගාර රසයෙන් මෙන් ම හාස්‍ය රසයෙන් පිරිපුන් රත්නාවලි නාට්‍යය විශිෂ්ට ප්‍රහසනයකි.' විමසන්න.

(ලකුණු 15)

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved



# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

# සිංහල - II

**13 ශ්‍රේණිය**

**කාලය පැය 03 යි.**

- **පළමු කොටසේ පළමුවන ප්‍රශ්නය ද, දෙවන කොටසේ 2, 3 ප්‍රශ්න ද ඇතුළු ව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**
- **පළමු ප්‍රශ්නයේ සියලු ම අනුකොටස්වලට මෙම පත්‍රයේ ම පිළිතුරු ලියන්න.**
- **පළමු කොටස හා දෙවන කොටස පිළිතුරුපත් සමඟ අමුණා භාරදෙන්න.**

---

## I කොටස

---

- **එක් එක් ප්‍රශ්නයට වඩාත් ම ගැළපෙන පිළිතුර තෝරාගෙන එයට හිමි අංකය වරහන් තුළ ලියන්න.**

(01) (1.1) **අර්ධ නාසික්‍යාක්ෂර** ලෙස සැලකෙන්නේ කවරක්ද?

(1) ප, ඵ, බ, භ, ම (2) ස, ඣ, ඪ, ධ, භ (3) ඟ, ඦ, ඬ, ඳ, ඹ

(4) ඹ, ඥ, ණ, න, ම (5) ශ, ෂ, ස, හ, ෆ (......)

(1.2) **නිවැරදි** අක්ෂර වින්‍යාසය සහිත පද පේළිය තෝරන්න.

(1) ශිෂ්ටාචාරය, මර්ධනය, සමස්ථ, ත්‍යාග ප්‍රධානය, සීඝ්‍ර
(2) ශිෂ්ටාචාරය, මර්දනය, සමස්ත, ත්‍යාග ප්‍රදානය, ශීඝ්‍ර
(3) ශිෂ්ටාචාරය, මර්දනය, සමස්ථ, ත්‍යාග ප්‍රධානය, ශීඝ්‍ර
(4) ශිෂ්ටාචාරය, මර්දනය, සමස්ත, ත්‍යාග ප්‍රධානය, ශීග්‍ර
(5) ශිෂ්ඨාචාරය, මර්දනය, සමස්ත, ත්‍යාග ප්‍රදානය, ශීඝ්‍ර (......)

(1.3) **අකාරාදී** පිළිවෙල අනුව **නිවැරදි** ව ලියා ඇති පද පේළිය තෝරන්න.

(1) කුවේට්, කොරියාව, කැනඩාව, කෙන්යාව
(2) ඇමෙරිකාව, අප්‍රිකාව, අයර්ලන්තය, ඇෆ්ගනිස්ථානය
(3) ස්වීඩනය, සූඩානය, සෝමාලියාව, සෞදි අරාබිය
(4) පාකිස්ථානය, පින්ලන්තය, ප්‍රංශය, පිලිපීනය
(5) බොලිවියාව, බල්ගේරියාව... බලුකිස්ථානය, බ්‍රසීලය, බුරුමය (......)

(1.4) පහත සඳහන් වරණ අතුරෙන් **නිවැරදි ප්‍රකාශය** තෝරන්න.

(1) "ර" අක්ෂරයේ අර්ධයක් නොයෙදෙන නිසා රකාරාංශය ලෙස එය හැඳින් වේ.
(2) 'ර්' ට පෙර ව්‍යඤ්ජනයක් ද, පසු ව 'උ' ස්වරය හැර වෙනත් ස්වරයක් ද යෙදෙන තැන්වල දී රකාරාංශය යෙදේ.
(3) රකාරාංශය මූර්ධජ අක්ෂර සමග ම යෙදිය යුතු ය.
(4) වචනයක මුල මැද අග යන තුන් තන්හි ම රකාරංශය යෙදිය හැකි ය.
(5) රකාරාංශය හා රේඵය යනු එකක් වෙනුවට අනෙක යෙදිය හැකි සංකේතය යි. (......)

(1.5) **යංශය, රේඵය, ගයනුකිත්ත හා විසර්ගය සහිත අනුපිළිවෙලින්** යෙදී ඇති පද පේළිය තෝරන්න.

(1) තර්ක, මෞලිය, අන්තඃස්ථ, වාක්‍ය (2) ව්‍යසන, වර්ගීය, බෞතීස්ම, අන්තඃපුර

(3) මනඃකල්පිත, සෞන්දර්ය, කර්මීය, නිත්‍ය (4) ව්‍යවස්ථා, ස්වර්ණ, අන්තඃඛණ්ඩ, නෞකාව

(5) සාකල්‍ය, සූර්ය, මනඃකල්පිත, ගෞතම (......)

(1.6) සෑම පදයක ම **පාපිල්ල** යෙදී ඇති පද පේළිය තෝරන්න.

(1) පුටුව, මයුර, විපත, සුවඳ (2) දුදන, මුස්න, වරුව, වැතිර

(3) නිසල, කොටුව,රුවල, වැහැරි (4) මීදුම, කිරුළ, දිනුම, සුවඳ

(5) මැටි, කණුව, වාහන, තාරුකා (......)

(1.7) **එකිනෙකට අනුරූප වන සේ වචන යුගල යෙදී ඇති** වරණය තෝරන්න.

(1) සෞන්දර්ය සන්ධ්‍යාව, භාෂා උත්සවය, ස්වදේශ ප්‍රවෘත්ති, බුදුරශ්මිය

(2) මනුෂ්‍ය දිවිය, සමුද්‍රඝෝෂ වෘත්තය, ජ්‍යොතිෂ්‍ය ශාස්ත්‍රය, කෝකිල සංදේශය

(3) ජ්‍යෙෂ්ඨ පුත්‍රයා, ස්ථානෝචිත ප්‍රඥාව, ශරිපුත්තමොග්ගල්ලාන, ප්‍රේමසාගරය

(4) තන්වැසි නුවණ, සොඳුරු දසුන, සෙල්ලිපි, දෙටුපුත්‍ර

(5) ඉසිඹුහල, දෙස්අබිමන, කලණ මිතුරා, විද්‍යාසක්විති (......)

(1.8) **තත්සම වචන පමණක්** යෙදී ඇති වරණය තෝරන්න.

(1) චක්‍රවර්ති, හෘදය, කාල්‍යාණ, වියරණ (2) අභිමාන, සෞම්‍ය, ජ්‍යෂ්ඨ, රූප, මැඳුර

(3) ග්‍රාමීය, සහස්‍ර, විශ්‍රාම, ගාමිණී, ඡන්දස් (4) අක්‍ෂර, ලාංඡනය, සදහම්, චාරිත්‍ර, අබිසෙස්

(5) දක්ෂිණ, පුස්තක, වෘත්තය, මධ්‍යම (......)

(1.9) මුලින් දැක්වෙන පදයට විරුද්ධාර්ථයක් නොදෙන පදයක් ඇතුළත් පද පේළිය තෝරන්න.

(1) ප්‍රාචීන අපරදිග, පැළදිග, බටහිර,ඉඳුරුදිග

(2) අප්‍රසිද්ධ ප්‍රකට, පසිඳු, පරසිඳු, ප්‍රසිද්ධ

(3) ආලෝක තිමිර, අඳුර, අන්ධකාර, කළුවර

(4) දියුණුව පිරිහීම, අවනතිය, පරිහානිය, අවගමනය

(5) සෙලවෙන නිසල, නිශ්චල, අචල, නොසැලෙන (......)

(1.10) මුලින් දී ඇති පදයට සමානාර්ථ පදයක් ඇතුළත් නොවන පදයක් ඇතුළත් පද පේළිය තෝරන්න.

(1) ඇතා මතඟ, වරණ, පිණිපා, හස්ති

(2) ඉක්මන නිලස් යුහු, වෙලෙව්, අනලස්

(3) සූර්යයා අඳුරුරුපු, ගහමිණි, සේරුස්, තික්මෙරද

(4) ඇස් චක්ෂු, නුවන්, අක්ෂි, සක්

(5) සමුද්‍ර අර්ණව, උදධි, දලනිඳු, රුවනාර (......)

(1.11) **අන්‍යාර්ථ, ද අරුත්, අව්‍යය, විශේෂණ සමාසවලට** අයත් පද පිළිවෙලින් දක්වා ඇති පද පේළිය තෝරන්න.

(1) කුමන්ත්‍රණ, නළුනිළි, දසබල, පාකමල්

(2) ලඹසවන්, සැරියුත්මුගලන්, විප්‍රයෝග, දසපනත

(3) දසබල, නිර්මල, අගමුල, රහල්තෙර

(4) සහතුරුවැල, මව්පිය, අපද්‍රව්‍ය, තිනෙත්

(5) ඉකුත්සයුරු, ගස්වැල්, කුප්‍රකට, තිලොනා (......)

(1.12) අනුක්ත පද දෙකක් හා උක්ත පද දෙකක් ඇති පද පේළිය තෝරන්න.

(1) සරච්චන්ද්‍රයෝ, කවීන්, ගංගාවන්, හරකුන්

(2) සමහරු, බුදුහු, සේකරයෝ, විහඟුන්

(3) සෙබළු, දෙවියන්, දේශකයෝ, කිඳුරන්

(4) මිනිසෙක්, කාන්තාවක, දරුවෙකු, සතුරන්

(5) හංසයෝ, ගායකයෝ, නැඟණියක්, තුරුලතාවෝ (......)

(1.13) "**<u>කළ පන්සිළු</u> නොනිසි - <u>වඩවන</u> <u>සුරගනන්</u> රිසි**" යන්නෙහි ඉරි ඇඳි පද පිළිබඳ වඩාත් හොඳින් ගැලපෙන වරණය කුමක්ද?

(1) මෙහි සමාස පද දෙකක්, සන්ධි පදයක් හා කෘදන්ත පද දෙකක් ඇත.
(2) මෙහි සන්ධි පදයක්, සමාස පද දෙකක් හා කෘදන්ත පදයක් ඇත.
(3) මෙහි සන්ධි පද දෙකක්, සමාස පදයක් හා කෘදන්ත පදයක් ඇත.
(4) මෙහි සමාස පදයක්, සන්ධි පදයක් හා කෘදන්ත පද දෙකක් ඇත.
(5) මෙහි ඇති සමාස පදවල විශේෂණ සමාසයේ ප්‍රභේද දක්නට ලැබේ. (......)

(1.14) **උපසර්ගයක් යෙදී නැති පදයක්** සහිත පද පේළිය තෝරන්න.

(1) අනුගමනය, විසංවාද, ප්‍රතිග්‍රහණ, අතිරික්ත
(2) අවංක, නිර්ලෝභී, අක්‍රීය, උපවනය
(3) අවලක්ෂණ, පරසිරිත්, අනුලෝම, නොමිනිස්
(4) නිරුත්සාහ, පරෝපකාර, උපගුරු, පරිකල්පන
(5) සංගායනා, අචින්ත්‍ය, පරිවහන, අතාත්වික (......)

(1.15) **ව්‍යාකරණානුකූල ව නො ගැළපෙන පදයක් සහිත පද පේළිය** තෝරන්න.

(1) බඳු, නොහොත්, වනාහී, සා (2) කැහැටු, කොයිබ, සෞන්දර්යය, මුහුදුබඩ
(3) විහඟ ගී, තිසරණ, වනමල්, දසබල (4) නැළවිලි, හැඬුම්, වැටීම්, සිඟමන්
(5) අඹුසැමි, කියුම්කෙරුම්, වාතදෝස, කැවිලිපෙවිලි (......)

(1.16) **තද්ධිත පදයක් ඇතුළත් නොවන** පද පේළිය තෝරන්න.

(1) බුද්ධිමත්, වජ්‍රමය, භෞමික, මොළකැටි
(2) ප්‍රාචීන, ගරුතර, අරටු, ස්වකීය
(3) දේවතා, මොබ, ස්වර්ණමය, ආලෝකවත්
(4) කැබිලිති, දැති, සිටාණෝ, ඖදාර්යය
(5) ධාර්මික, ඇහැටු, බිබිලි, විදුරුමුවා (......)

(1.17) පහත සඳහන් වැකිවල තදකළු අකුරින් මුද්‍රිත පද අයත් ක්‍රියා වර්ගය පිළිවෙළින් දක්වා ඇති වරණය තෝරන්න.

❖ ඡන්ද අපේක්ෂකයා මනාපය **අයදින්නට** ගෙන්ගෙට ගියේ ය.
❖ මහලු මිනිසා මුව පුරා **සිනාසෙමින්** පදිකයින් ඇමතුවේ ය.
❖ ගෘහණිය ගේදොර **අතුපතු ගා** බුදුන් වඳින්නී ය.
❖ අවරින් හිරු **බැසයත** හාත්පස අඳුර පැතිර යයි.

(1) අපර ක්‍රියා, පූර්ව ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, මිශ්‍ර ක්‍රියා
(2) අපර ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, පූර්ව ක්‍රියා
(3) පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, අපර ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා,
(4) අපර ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, පූර්ව ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා
(5) අසම්භාව්‍ය ක්‍රියා, අපර ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, පූර්ව ක්‍රියා (......)

(1.18) පහත සඳහන් වාක්‍යවල **අංකිත පදවල නොගැළපෙන ව්‍යාකරණ අංගය** දැක්වෙන වරණය තෝරන්න.

(1) කොස් **අත්තෙහි** ගෙඩි පැසී ඇත. (ආධාර කාරකය)
(2) ගොවියා **උදැල්ලෙන්** කුඹුර කොටයි. (කරණ කාරකය)
(3) වෛද්‍යවරු **ගිලනුන්ට** ඖෂධ නියම කරති. (සම්ප්‍රදාන කාරකය)
(4) ලේනා ජම්බු **ගසෙන්** බිමට පැන්නේ ය. (අවධිකාරකය)

(1.19) **ව්‍යාකරණානුකූල ව නිවැරදි වාක්‍යය තෝරන්න.**

(1) ක්‍රීඩා ලෝලීන් ජය ඝෝෂා නගද්දී ක්‍රීඩකයෝ ජයග්‍රාහණය උදෙසා තරඟ වැදුණා හ.
(2) මම ද, ඔහු ද ඇයට ආදරය කරමි.
(3) ගුරුවරයෙක් වූ ඔහු දක්ෂ ගායකයෙක් ද වෙයි.
(4) මේ බසයේ මගීන් කවරහු ද?
(5) රෝහලේ වෛද්‍යවරුන් ඇත. (......)

(1.20) **නිවැරදි පද බෙදීම සහිත වාක්‍යය තෝරන්න.**

(1) සද්ධර්මාලංකාරය ලිවීම සඳහා පාදකකරගත්තේ පාලිරසවාහිනියයි.
(2) පන්සියපනස්ජාතකපොතෙහි ඇතුළත්දීර්ඝ තම කථාවවනුයේ උම්මග්ගජාතකයයි.
(3) ජනමාධ්‍යමගින් කෙරෙන්නේ පුද්ගලයින්දැනු වත්කිරීම පමණක්නොව, ඔවුන් ගේ අධ්‍යාපන මට්ටමද ඉහළට නැංවීමයි.
(4) පොතපතට ම සීමා වූ අධ්‍යාපනයට වඩා ප්‍රායෝගික ක්‍රියාකාරකම් ද ඇතුළත් වන සේ සකස් කළ අධ්‍යාපනය ළමයින්ට ඉතා වැදගත් වේ.
(5) සුබ මොහොතඑළඹුනු විට මනාලයුවල ද කුණු කකුල පෙරට තබාසිය නෑයින් සමග ම ගමන් ඇරඹූහ. (......)

(ලකුණු 20)

---

## II කොටස

---

- **මෙම කොටසින් 2, 3 ප්‍රශ්න ඇතුළුව ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.**

(02) (අ) පහත සඳහන් ඡේදය කියවා ඒ පිළිබඳව අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

පෘතුගීසි උවදුරෙන් බේරෙත් ම ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ ඕලන්දයන්ගේ පාලන බලයට යටත් විය. අවුරුදු එකසිය පනහක් පමණ පහතරට ආණ්ඩු කළ ඕලන්දක්කාරයෝ ද ශිල්ප ශාස්ත්‍ර දියුණු කිරීමෙහි නිරත නො වූහ. වෙළෙඳාමෙන් ධනය සම්භ කිරීම ඔවුන්ගේ එක ම අභිලාෂය විය. මේ සමයෙහි ස්වාධීන සිංහල රාජ්‍යයක් උඩරට පළාත්වල පැවති නමුත් දකුණු ඉන්දියානු ද්‍රවිඩ රජවරු එහි රජකම් කළහ. කැඩී බිඳී යන පැරණි රදළ ක්‍රමයකින් යුක්ත වූ උඩරට සිංහල සමාජය අතර මනුෂ්‍ය ශිෂ්ටාචාරයේ උසස් අංග විද්‍යාමාන නො වී ය. සිංහල හෝ දමිළ හෝ යම්තම් ලියන්නට කියවන්නට ඉගෙන ගැනීමත් හැර කිසි අධ්‍යාපනයක් එකල උඩරට හෝ පහතරට හෝ නො තිබුණේ ය. අවුරුදු තුන් සියයකට පෙර පටන් පිරිහෙමින් පැවති චිත්‍ර ශිල්පයත්, සංගීතයත් මේ කාලයේදී සිංහලයන් අතුරින් සම්පූර්ණයෙන් ම බැහැර ගොස් තිබුණු බව පෙනෙන්නට ඇත්තේ ය. ආගමික කෘත්‍යයන්ට ද යාගනෝමාදියටද අවශ්‍ය වූ නිසා නැටුම් ශිල්පය රක්ෂාවක් කොට ගත් ඇතැම් කුලවල මිනිස්සු නාට්‍ය ශිල්පය ආරක්ෂා කළහ. ලංකාවේ පැරණි කලාවන් අතුරින් නාට්‍ය ශිල්පය පමණක් සිංහලයන් අතර ශේෂ ව පැවතුණේ මේ නිසා ය.

(1) ඕලන්දීයයන්ගේ එකම අභිලාෂය වෙළෙඳාම වීම පමණක් වූ නිසා වූ සමාජ පරිහාණිය කවරක් ද?
(2) උඩරට සිංහල සමාජයේ තත්ත්වය කෙබඳු වී දැයි එක් වාක්‍යයකින් දක්වන්න.
(3) එකල වූයේ කෙබඳු අධ්‍යාපනයක් ද?
(4) හෙළ කලා පිරිහීමට පටන් ගත්තේ ශතවර්ෂ කීයකට පෙර සිට ද?
(5) නට්‍ය ශිල්පය පමණක් හෙළ කලා අතුරින් ඉතිරිවන්නට බලපෑ හේතුව වශයෙන් මෙහි සඳහන් වන්නේ කවරක් ද?

(ලකුණු 2×5 = 10)

(ආ) පහත දැක්වෙන උද්ධෘතය කියවා එහි වචන සංඛ්‍යාව **තුනෙන් එකක්** පමණ වනසේ සාරාංශ කොට ලියා එහි වචන සංඛ්‍යාව ද සඳහන් කරන්න.

ලංකාව විදේශීය ආධිපත්‍යයට අසුවීමට පෙර මුළු රටේ ම අධ්‍යාපනය පැවතියේ ඒ ඒ ගම්වල පැවති පන්සල් මගිනි. පන්සල් මගින් මූලික අධ්‍යාපනයක් ලැබීමෙන් පසු උසස් අධ්‍යාපනයක් ලබා දීම සඳහා සෑම පෙදෙසක ම ගම් කීපයකට එක පිරිවෙණක් බැගින් පිහිටුවා තිබුණේ ය. කෝට්ටේ හෙවත් ජයවර්ධනපුරසමය වන විට, ලංකාවේ පැවති ඉතා උසස් පිරිවෙන් සංඛ්‍යාවක් ගැන ලංකා ඉතිහාසයෙහි සඳහන් වෙයි. එහෙත් පහතරට පරංගීන් සතුවීමෙන් පසු මේ පිරිවෙන් සියල්ල ම අභාවයට පත් වූ බව සැලකිය හැකි ය. ඕලන්ද සමයේ ද පන්සල් අධ්‍යාපනයට සහ පිරිවෙන් අධ්‍යාපනයට කිසි ම රැකුලක් නොලැබුණේ ය. ඉංග්‍රීසි ආණ්ඩුව ද මුල් කාලයේ ක්‍රියා කළේ පන්සල් අධ්‍යාපනය සහ පිරිවෙන් අධ්‍යාපනය නැති කර දැමීමට ය. එහෙත් භික්ෂූන්වහන්සේගේත්, බෞද්ධ මහජනතාවගේත් උනන්දුව නිසා ආරම්භ කරන ලද පිරිවෙන් කීහිපයකට යටත් විජිත ආණ්ඩුව විසින් ආධාර දීමට පටන් ගන්නා ලදී. එහෙත් එය පුංචි අම්මාගේ සැලකිල්ලට වඩා වැඩි වෙනසක් නොවූ බව කිව හැකිය. මහජන ආණ්ඩුව විසින් පිරිවෙන් දෙකක් විශ්ව විද්‍යාලයීය තත්ත්වයට ගෙන ඒමට තැත් කරන අතර, අනෙක් පිරිවෙන්වල තත්ත්වයද දියුණු කිරීම සඳහා දැනට දෙනු ලබන ආධාර මෙන් දෙගුණයක් ආධාර දීමට තීරණය කර ගැනීම ඉතා වැදගත් බව සැලකිය යුතු ය. මේ වනතුරු පිරිවෙන් සම්බන්ධයෙන් පැවති මූලික හා උපරිම යන භේදය ආධාරදීමේදී මින් මතුවට නොසැලකීමට කර ගත් තීරණය ද මහජන ප්‍රසාදයට හේත වන බව ප්‍රකාශ කරමු. (ලකුණු 15)

(03) දී ඇති මාතෘකාවලින් එකකට අදාළව වචන 300 350 අතර වන සේ ව්‍යාරණානුකූලව විශ්ලේෂණාත්මක රචනාවක් ලියන්න.

(1) ජනමාධ්‍යයේ කාර්යභාරය විය යුත්තේ දැනුම හා බුද්ධිය අතින් සමාජය ඉහළ නැංවීමයි.

(2) ඉංග්‍රීසි භාෂාඥානය ලෝකයට පිවිසීම සඳහා ඇති අනගි දොරටුවකි.

(3) ගංවතුර හා නායයාම් නිසා ශ්‍රී ලාංකිකයා මුහුණපාන ගැටලු.

(4) ශ්‍රී ලංකාවේ ස්වයං රැකියා නංවාලීම සඳහා ගතයුතු ක්‍රියාමාර්ග.

(5) අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍යවල මිල ඉහළයාම නිසා අසරණ තත්ත්වයට පත් වී සිටින රැකියා විරහිත ජනතාව

(6) රටක රැකියා අවශ්‍යතාවලට යෝග්‍ය ආකාරයෙන් උසස් අධ්‍යාපනය සකස් කිරීමේ වැදගත්කම

(ලකුණු 25)

(04) (අ) පහත සඳහන් වාක්‍යවල <u>සදොස් තැන් ඇතොත් නිදොස් කොට</u> ලියන්න.

(1) ඕ තොමෝ මිහිරි ලෙස ගී ගයමින් රංගනයක යෙදුණහ.

(2) තම සුවදුක් බැලීමට දරුවෝ පැමිණෙතැ'යි මහලු දෙමව්පියෝ සිතුහ.

(3) සියලු ජයග්‍රාහකයෝ පිටිසර පළාත්වලින් පැමිණ ඇත.

(4) විදුහල්පතිතුමා පාසලේ අභිවෘද්ධිය උදෙසා කැපවීමෙන් කටයුතු කළහ.

(5) තම පුතුගේ ජයග්‍රහණය පිළිබඳ ව දෙමාපියන් සතුටු වූහ. (ලකුණු 05)

(ආ) පහත සඳහන් <u>වාක්‍ය **කර්මකාරකයට**</u> හරවන්න.

(1) වෛද්‍යවරු රෝගීන් සුවපත් කරති.

(2) ඔවුහු දැරියක පැහැර ගත්හ.

(3) කම්කරුවා ලොරියට වී මලු පටවයි.

(4) කිවිඳාණෝ අප පිනවූහ.

(5) බැතිමත්හු දේව පූජාවන් කරති. (ලකුණු 05)

(ඉ) නිවැරදි වාක්‍යයක් නිර්මාණය කිරීම සඳහා සුදුසු පදය වරහන් තුළින් තෝරා ලියන්න.

(1) .............................................................................. (මා / මම) දෙවියන් දකින්නේ කවර දා ද?

(2) ............................................... (සැබෑ නායකයෙක් / සැබෑ නායකයෙකු) ලොවට පහළ වේවා!

(3) තාරකා සමූහය ළමයින්ගේ සිත් .................................................................. (පිනවයි / පිනවති)

(4) ............................................... (ආරාධිතයෝ / ආරාධිතයන්) පැමිණියහොත් උත්සවය නියමිත වේලාවට ආරම්භ වේවි.

(5) ................................................................ (අප / අපි) පැමිණෙති'යි ඔවුහු බලාපොරොත්තු වූහ.

(ලකුණු 05)

(05 × 03 = 15)

(05) (අ) පහත දැක්වෙන වාක්‍යවල තද කළු අකුරෙන් දක්වා ඇති පදවල අර්ථ විග්‍රහ කර ලියන්න.

(1) රජතුමා වෙස්වළා ගෙන යනඅතර **පසල් ගමක** රාත්‍රිය ගත කළේ ය.

(2) රණබිමෙහි පරසතුරන් විධ්වංසනය කළ **සෙබළ** මුළ පලා ගියහ.

(3) නන්දකුමරුගේ සරණ මංගල්‍යය, **මෞලිමංගල්‍යය**, ගෙවදීමේ මංගල්‍යය යන මඟුල් තුන ම එදිනට නියමිත ය.

(ලකුණු 03)

(ආ) පහත සඳහන් යෙදුම් වලට **වඩාත් සුදුසු තනිපදය** ලියන්න.

(1) කටුකොහොල් හැර අලුත්වැඩියා කිරීම

(2) බියගැන්වීමට සැරවැර කිරීම

(3) දීර්ඝ කාලයක් තිස්සේ පැවතීම (ලකුණු 03)

(ඉ) පහත දී ඇති වාක්‍යවල **හිස්තැනට වඩාත්ම ගැලපෙන පදය** පහළ වරහන් තුළ දී ඇති පද අතුරෙන් තෝරා ලියන්න.

(1) දසත බබළන තොරණින් සියලු නගරය ම ...................................................................... විය.

(2) රණවිරුවන් සැමරීමේ .............................................................. යුද හමුදා පිටියේදී පැවැත් වේ.

(3) රහල් හිමිත්, වැත්තෑවේ හිමිත් කෝට්ටේ යුගයේ සාහිත්‍යය ...................................... කළෝ ය.

(4) විශ්වවිද්‍යාලයීය උපාධි ...................................................... සම්මන්ත්‍රණ ශාලාවේදී පැවැත්විණි.

(5) ජාත්‍යන්තර ................................................................ රටක පැවැත්මට අතිශයින් වැදගත් ය.

(6) අඹුසැමි ....................................................................... වර්ධනය වන්නේ මනා අවබෝධයක් තිබේ නම් පමණි.

(ඒකාලෝක / සම්බන්ධතා / සබඳතා / ප්‍රධානෝත්සවය / ප්‍රදානෝත්සවය / ආලෝකවත්)

(ලකුණු 03)

(ඊ) **තද කළු අකුරින්** දක්වා ඇති <u>බහු අර්ථ පදය යොදා වෙනත් අරුතක් දෙන ලෙස</u> වාක්‍යය බැගින් ලියන්න.

(1) අනුන්ගේ දුක දැක කිසිවිටෙකත් ඔහු **සරණ** නොවී නොසිටී.

(2) සත් **සර** නංවන මියුරු හඬින් ශාලාව ප්‍රබෝධවත් විය.

(3) සම්බුලාවගේ පින් මහිමය නිසා ම **සක්** දෙව් එතැනට සැපත් විය.

(4) **නව** අරහාදී බුදුගුණ නිතර සිහි කරන්න.

(5) ලෝ දහමින් වැදෙනා රළු පහරින් **ගත** සිත රිදෙනා කල නිතියෙන්

(6) එම ලෝහමය බඳුනේ **මල** කෑ තැන් බොහෝ ය. (ලකුණු 06)

(ලකුණු 3 + 3 + 3 + 6 = 15)

(06) **තද කළු අකුරින්** දක්වා ඇති පද **කුමන** ව්‍යාකරණ අංගයට අයත්දැයි දක්වන්න.

(1) **අද්‍යතන** ලේඛකයෝ නව මං ඔස්සේ **කාව්‍යාලංකාර** නිමකරත්.

(2) **දසතින්** නැගෙන **ගෙරවිලි** හඬ නිසා සියොත් හු වහා **පියාඹා** ගියහ.

(3) **මිත්තණියෝ** මුනුබුරන් **අමතමින්** **රසබරකතා** කියූහ.

(4) **ගුරුතුමා** ශිෂ්‍යයා දුන් **ප්‍රතිඋත්තර** අසා වහා දඬුවම නතර කළේය.

(5) **ප්‍රවීණතම** ගායකයාගේ ගීත සැමරුම් උළෙල රසික සිත් **ප්‍රකම්පනය** කළේ ය.(ලකුණු 3 × 5 = 15)

(07) (අ) පහත දැක්වෙන යෙදුම්වලට වඩාත් හොඳින් ගැලපෙන **ප්‍රස්තාව පිරුළ** ලියන්න.

(1) ඉතා හිතවත් ලෙස

(2) මඳ උගෙනුම ලැබූ තැනැත්තාගේ කෑකෝ ගැසීම.

(3) අය මාර්ග මුළුමනින් ම වසා ගැනීම.

(4) හොඳ මිනිසුන් මෙන් සිට වැරදි කිරීම.

(5) අනුන් රවටන්නට ගොස් තමා ම රැවටීම.

(6) ජන්ම ගතිය වෙනස් නොවීම. (ලකුණු 03)

(ආ) පහත දී ඇති රූඩීවල අදහස පැහැදිලි වනසේ වාක්‍යවල යොදන්න.

| | |
|---|---|
| (1) කුරුල්ලන්ට වැට බැඳීම | (4) බළලුන් ලබා කොස් ඇට බැවීම |
| (2) උගුරට හොරා බෙහෙත් කෑම | (5) ආතාට අටුකොස් දීම |
| (3) පාළු ගෙයි වළං බිඳීම | (6) නරියා පඹගාලේ පැටලීම |

(ලකුණු 03)

(ඉ) පහත දී ඇති එක් එක් **යුගල පද සැදී ඇති රටාව** කුමක්දැයි දක්වන්න.

| | | | |
|---|---|---|---|
| (1) | උඩයට | (4) | බේත්හේත් |
| (2) | චිරිස්බිරිස් | (5) | ඉඳුම්හිටුම් |
| (3) | මිලමුදල් | (6) | ඇතිනැති |

(ලකුණු 03)

(ඊ) පහත දී ඇති ප්‍රාදේශික ව්‍යවහාර සඳහා **පොදු භාවිතයේ යෙදෙන පද** ලියා දක්වන්න.

| | | | |
|---|---|---|---|
| (1) | අඩ්ඩඩ්ඩාවට | (4) | හේ බානවා |
| (2) | බූටෑව | (5) | වැහි කේදිලි |
| (3) | අරියාදු කරනවා | (6) | කුයිල |

(ලකුණු 03)

(උ) පහත දී ඇති **ප්‍රාස්තාවික ව්‍යවහාරයන්ට** දිය හැකි පොදු භාවිතයේ යෙදෙන අරුත් ලියන්න.

| | | | |
|---|---|---|---|
| (1) | මළුව | (4) | ආතුරයා |
| (2) | හේමකඳ | (5) | අරක්වළ |
| (3) | වාන්පතුල් | (6) | මාරියාව |

(ලකුණු 03)

(03 × 05 = 15)

(08) පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

වනචාරීවූආදීකල්පිකමිනිසාතමආහාරසපයාගත්තේස්වාභාවිකවවැවුණුනොයෙකුත්ගෙඩිඇටධාන්‍යඅලමුල්ආදියරැස්කරගැනීමෙන්දජලාශයවලසිටිමසුන්සහකැලෑවලජීවත්වූඅනෙකුත්සතුන්මරාගැනීමෙන්දවේඔහුවවාගෙනකෑමටඉගෙනගත්තේරැස්කරගෙනකෑමටඉගෙනගෙනබොහෝකාලයක්ගියාටපසුවයඑපමණක්දනොවඔහුමුලින්මඉගෙනගත්තේවැවීමනොවසතුන්හීලෑකිරීමවීමදපුළුවනතමාවිසූප්‍රදේශයේතිබූගස්වැල්ආදියයම්හේතුවක්නිසාමැරීගියේනම්හෝසත්තුවඳවීගියාහුනම්ඔහුටඑමප්‍රදේශයඅතහැරවෙනත්ප්‍රදේශයකටයාමටමුලදීසිදුවූනම්ත්වවාගැනීමහාසතුන්ඇතිකිරීමසොයාගැනීමෙන්පසුබොහෝවිටඑක්තැනෙකනිත්‍යවාසයකිරීමටපුළුවන්කමලැබිණඇතැම්පැළෑටිවර්ගවෙනත්ඒවාටවඩාආහාරවශයෙන්අගනාබවඑසේමමේවාඅළුවලින්බෝකරගනෙවිශේෂතැන්වලවවාගතහැකිබවදඔහුටමුලදීමපෙනුණාවියහැකියඅවුස්සාබුරුල්කළපයෙහිගස්වැල්වර්ගවඩාහොඳින්වැවෙනබවසොයාගැනීමකෘෂිකර්මාන්තයේආරම්භයවියහැකිය.

(1) ඉහත ඡේදය නිවැරදි ලෙස පද බෙදා, අවශ්‍ය විරාම ලක්ෂණ යොදා නැවත ලියන්න.

(2) යංශය හා රකාරාංශය සහිත පද දෙකක් ලියන්න.

(3) මේ ඡේදයේ පාපිලි යෙදී ඇති පද දෙකක් ලියන්න.

(4) මේ ඡේදයේ 'කෘෂිකර්මයේ' යන පදයෙහි ඇතුළත් පිල්ලම් නම් කරන්න.

(5) මේ ඡේදයේ ඇතුළත් නොවන ගැටය සහිත ඇලපිල්ල හා රකාරාංශය සහිත පද දෙකක් ලියන්න.

(ලකුණු 3 × 5= 15)